කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/2017

**PSC - 2239 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය : න්‍යාය සහ භාවිතය**

කාලය : පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

**එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය විස්සකි (20).**

---

01. පහත සඳහන් දෑ සාකච්ඡා කරන්න :

(i) බ්‍රිතාන්‍යයේ අලිඛිත ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තු සම්ප්‍රදායන්.

(ii) '1947 සෝල්බරි ව්‍යවස්ථාව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායන් මත පදනම් වී ඇත'.

02. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අදාළ ව ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

03. 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය පිළිබඳ සංවාදය විවේචනාත්මක ව විභාග කරන්න.

04. (i) 1978 ව්‍යවස්ථාව තුළින් හඳුන්වාදෙනු ලැබූ මූලික අයිතිවාසිකම් මොනවා ද?

(ii) ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් සඳහා වන සීමා මොනවා ද?

05. (i) 1978 ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ධුරය වටා බලතල කේන්ද්‍රගත ව ඇත්තේ කෙසේ ද?

(ii) ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිත්වය සම්බන්ධයෙන් වන විවාදය විවේචනාත්මක ව විභාග කරන්න.

06. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය පැහැදිලි කොට ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය ප්‍රායෝගික ව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විවේචනාත්මක ව පැහැදිලි කරන්න.

07. පහත සඳහන් ඕනෑ ම මාතෘකා දෙකක් **(02)** පිළිබඳ සටහන් ලියන්න.

(i) 13 වන ව්‍යවස්ථා සංශෝධනය අදාළ ව බලය විමධ්‍යගත කිරීම පිළිබඳ වර්තමාන සාකච්ඡාව

(ii) 1972 ස්වස්ථානික ව්‍යවස්ථාව

(iii) ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන්වරයාගේ භූමිකාව

(iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය

********************